Verité Research
Strategic Analysis for Asia

# ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳ බාධක:

## කෘෂි අපනයනයන් පිළිබඳ සිද්ධි අධ්‍යයනයන්

පෙබරවාරි 2017

# ශ්‍රී ලංකාවේ දේශීය වෙළඳ බාධක:

## කෘෂි අපනයනයන් පිළිබඳ සිද්ධි අධ්‍යයනයන්

වෙරිටේ පර්යේෂණ ආයතනය, ලංකා පළතුරු සහ එළවළු නිෂ්පාදකයන්ගේ සහ අපනයනකරුවන්ගේ සංගමයේ සහයෝගිතාව ඇතුව මෙම අධ්‍යයනය සම්පාදනය කරන ලදී. එම සංගමය විසින් පර්යේෂණය කිරීමට ලබා දුන් මාර්ගෝපදේශනයට සහ සාකච්ඡාවලට සහභාගී වීමෙන් ලබා දුන් සහායට, වෙරිටේ පර්යේෂණ ආයතනය ස්තුතිය පුද කරයි.

වෙරිටේ පර්යේෂණ ආයතනයේ ආර්ථික විද්‍යා පර්යේෂණ කණ්ඩායම විසින් මෙම අධ්‍යයනය කරන ලදී. මෙම අධ්‍යයනය හස්නා මුනාස්, සුභාෂිනී අබේසිංහ, සහ දිනූ වික්‍රමගේ විසින්, අනෝජ් ඒකනායක, අනීශා ගුරුගේ, අනූශන් කපිලන් සහ උමේෂ් මොරමුදලිගේ පර්යේෂණ සහායද ඇතුව සිදු කරන ලදී. අනිෂ්කා අර්සකුලරත්න මෙයට සංස්කරණයෙන් දායක විය. මෙම අධ්‍යයනයට අවශ්‍ය තොරතුරු ලබා දුන් අදාල පෞද්ගලික සහ රාජ්‍ය ආයතනවල මහත්ම මහත්මීන්ට, පර්යේෂණ කණ්ඩායම සිය ස්තුතිය පුද කරයි.

Email comments to: publications@veriteresearch.org

Verité Research aims to be a leader in the provision of information and analysis for negotiations and policy making in Asia, while also promoting dialogue and education for social development in the region. The firm contributes actively to research and dialogue in the areas of economics, sociology, politics, law, and media, and provides services in data collection, information verification, strategy development, and decision analysis.

Copyright © 2017 Verité Research. All rights reserved.

# විධායක සාරාංශය

එළඹී සියවසේ මුල පටන්ම ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ කාර්යසාධනය පහළ මට්ටමක පවතී. දළ ජාතික නිෂ්පාදනය (ද.ජා.නි.) හා අපනයන අතර අනුපාතය 2000 වසරේ දී ද.ජා.නි.න් 33.3%ක සිට 2015 දී ද.ජා.නි.න් 12.8%ක් දක්වා කඩා වැටී ඇත. ඊට අමතරව, 2011 වසරේ පටන් අපනයන ආදායමද වාර්ෂිකව පහත වැටීමකට ලක් වී තිබේ. ශ්‍රී ලංකා රජය මේ සඳහා ප්‍රතිචාර දක්වමින් ඔත්පල වී ඇති අපනයන අංශය පුනර්ජීවනය කරලීම තම ආර්ථික ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ ප්‍රමුඛතාවයක් ලෙස පෙරට ගෙන ඇත.

අපනයන අංශය නැවත පණ ගැන්වීමට නම් අපනයන තරගකාරිත්වය අඩාල කිරීමට හේතුවන වෙළඳ බාධක හඳුනාගැනීම හා ඊට පිළියම් යෙදීම අවශ්‍ය වේ. වෙළඳ බාධක යනු, අපනයනවල පිරිවැය, ගුණාත්මකභාවය, ප්‍රමාණය, හෝ නිෂ්පාදනයන් නියමිත කාලයට සැපයීම කෙරෙහි බලපාන, අපනයනකරුවාගේ ඍජු පාලනයෙන් ඔබ්බෙහි පවතින සාධක යි. අපනයනය කරන රට තුළ දක්නට ලැබෙන එවන් බාධක දේශීය වෙළඳ බාධක ලෙස ද, එම අපනයන විදේශයන්ට ඇතුළු වීමේදී මුහුණ දෙන බාධක විදේශීය වෙළඳ බාධක ලෙස ද හැඳින්වේ.

රජයේ මෑත කාලීන අවධානය වඩාත් යොමු වී ඇත්තේ නිදහස් වෙළඳ ගිවිසුම් හරහා විදේශ වෙළඳ බාධක අඩු කර ගනිමින්, එම වෙළඳ පලවලට ඇතුළු වීමේ හැකියාව ඉහළ නංවා ගැනීම කෙරෙහි ය. ඒ හා සසඳන කල, අපනයන තරගකාරිත්වයට බලපාන දේශීය වෙළඳ බාධක කෙරෙහි යොමු වී ඇත්තේ මඳ අවධානයකි. අපනයන අංශය ප්‍රවර්ධනය සඳහා, විදේශීය මෙන්ම දේශීය වෙළඳ බාධක ද අවම කර ගැනීමට කටයුතු කිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ දේශ සීමාවේදී මුහුණ දෙන්නට සිදුවන දේශීය වෙළඳ බාධක හඳුනා ගැනීමත්, විශේෂයෙන්ම කෘෂි කාර්මික අපනයන කෙරෙහි ඉන් එල්ල වන බලපෑම විශ්ලේෂණය කිරීමත්, මෙම අධ්‍යයනයේ ඉලක්ක වේ. 2015 දී ඇමරිකානු ඩොලර් බිලියන 2.5ක අගයක් ගත් මෙරට කෘෂිනිෂ්පාදන, සමස්ත අපනයනවලින් 25%ක පංගුවක් හිමිකර ගත්තේ ය. සමස්ත කෘෂිකාර්මික අපනයනවලින් 50%ක් තේ ආශ්‍රිතව සිදු විය. පොල් හා කුළු බඩු අපනයන තවත් 33% කට හිමිකම් කී අතර, ඉතිරි 17% සමන්විත

වී තිබුණේ විසිතුරු මල්, කොළ අතු, එළවළු හා පළතුරු, සුළු බෝග හා මත්ස්‍ය නිෂ්පාදනවලිනි. අධ්‍යයනයේ දී පෙනී ගියේ දේශීය වෙළඳ අවහිරතා අපනයනවල වර්ධනය හා විවිධාංගීකරණය කෙරෙහි ප්‍රබල බාධකයක් වී ඇති බවයි. කල් තබා ගත නොහැකි කෘෂි නිෂ්පාදනවල දී මෙම අවහිරතා විසින් ඇති කරන ඍණාත්මක බලපෑම විශේෂයෙන්ම ඉස්මතු වී පෙනෙන බව කියවිණි. එකී බාධාවන් හේතුවෙන් ඇතිවන ප්‍රමාදයන් කරුණු කොටගෙන එකී නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා ජීව කාලය අප්‍රතිවර්ත්‍ය ලෙස ඍණාත්මක බලපෑමකට ලක් වේ. මෙම බාධක ඉවත් කිරීම අපනයන ප්‍රවර්ධනයට ඉමහත් දායකත්වයක් වනු ඇත.

යෙදවුම් (බීජ, පොහොර) ආනයනය කිරීමේදී ද නිමි නිෂ්පාදනයන් අපනයනය කිරීමේ දී ද අපනයනකරුවන්ට මුහුණ දීමට සිදුවන වෙළඳ බාධක මෙම අධ්‍යයනයේ දී හඳුනා ගැනේ. මෙම වෙළඳ බාධක ප්‍රධාන ප්‍රවර්ගයන් තුනකට බෙද දැක්විය හැකිය. එනම්, i) නියාමන බාධක, ii) ක්‍රියාපටිපාටිමය බාධක හා iii) තොරතුරුමය බාධක ය. එක් එක් ප්‍රවර්ගය පිළිබඳව කරන ලද සිද්ධි අධ්‍යයනයේ දී එකී බාධකය නිදසුන් සහිතව පෙන්වා දෙමින් අපනයනයන් සඳහා ඉන් ඇති කෙරෙන බලපෑම පැහැදිලි කෙරෙනු ඇත.

## නියාමන බාධා

ස්වස්ථතා සහ ශාක ස්වස්ථතා ක්‍රියාමාර්ග (SPS) ලෙස සුලබව හැඳින්වෙන කෘෂි වෙළඳාම තුළ බල පැවැත්වෙන නියාමනවල අරමුණ වන්නේ මනුෂ්‍ය, ශාක හා සත්ත්ව ජීවයේ සෞඛ්‍ය සහ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගැනීමයි. ඕනෑම රටකට මුහුණ දීමට සිදුවන අභියෝගය නම් මෙම රෙගුලාසි වෙළඳාම කෙරෙහි අනවශ්‍ය බාධාවක්වීම වළක්වා ගනිමින් එම අරමුණ සාක්ෂාත් කර ගැනීමයි. රෙගුලාසි නිර්මාණය කිරීමේදී

1. පර්යේෂණයන් හා පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබා ගැනීම
2. නිරතුරුව සමාලෝචනය කරමින් යාවත්කාලීන කිරීම සහ
3. රෙගුලාසි අර්ථකථනය කිරීමේදී ස්ථාවර භාවය ආරක්ෂා වන ලෙස ඒවා සැකසීම,

යන පියවර අනුගමනය කිරීම මෙකී අභියෝගය ජය ගැනීමට බෙහෙවින් උපකාරී වනු ඇත. ශ්‍රී ලංකාව තුළ නියාමනයන් ගොඩ නැංවීමේ ක්‍රියාවලිය තුළ පවතින දුර්වලතා හේතුවෙන් ඒවා වෙළඳ බාධක බවට පත්වන අවස්ථා මෙන්ම, වෙළඳාම කෙරෙන කෘෂි නිෂ්පාදනවල ගුණාත්මක භාවයද එමගින් අහිතකර බලපෑම් ඇති කරන අවස්ථා ගණනාවක් අධ්‍යයනය තුළ දී හඳුනා ගනු ලැබිණි.

1. පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබා ගැනීම දුර්වල මට්ටමක පැවතීම.

නියාමනයන් ගොඩ නඟා ගැනීමේ දී අදාළ පාර්ශවකරුවන් ගේ උපදෙස් ලබාගැනීමෙන් නියාමනයන් හි සුජාතභාවය ද, විශ්වාසනීයත්වය ද වැඩි දියුණු වන අතර, ඒවායේ ඵලදායීත්වය ඉහළ යාමට ද ස්වේච්ඡාවෙන්ම අනුගත වීමට ද හේතු වේ. පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබා ගැනීමක් සිදු නොවීම, වෙළඳාම කෙරෙහි නියාමනයන් බාධාවක් වීමට බලපාන ප්‍රධාන හේතුවක් බව අධ්‍යයනය තුළින් හෙළි වී ඇත.

උදාහරණයක් ලෙස පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබා ගැනීම සඳහා පුළුල් ලෙස භාවිතා වන එක් ප්‍රවේශයක් නම් උපදේශන සභාවන් යොදා ගැනීමයි. 2003 අංක 22 දරණ බීජ පනත යටතේ යෝජිත ජාතික බීජ සභාව (ජා.බී.ස.) සියළු අදාළ පොදු හා පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගෙන් සමන්විත වෙමින්, බීජ සහ පැළ නිෂ්පාදනය හා සැපයීම සම්බන්ධ සියළු කරුණුවලට අදාළ උපදේශන හා අධීක්ෂණ දේහය ලෙස ක්‍රියා කිරීමට අපේක්ෂිත ය. මෙරට අපනයන විභවය කෙරෙහි අකුල් හෙළනල බීජ සහ පැළ ආනයනය කිරීමේදී ව්‍යාපාරිකයන් මුහුණ දෙන ගැටළු ගණනාවක් අධ්‍යයනයන් තුළින් හඳුනාගෙන ඇති අතර, ජා.බී.ස.ට මේවා සඳහා විසඳුම් ලබා දීමට සහාය විය හැකිය. එහෙත් පනත බලාත්මක කොට

වසර 14ක් ගෙවී ඇතත් ජා.බී.ස. තවමත් පිහිටුවා නැත. ජා.බී.ස. ස්ථාපිත කිරීමට අසමත් වීම ගැටළු දිගින් දිගට කල් යාමට සහ විසඳුම් ලබාගැනීම ප්‍රමාද වීමට හේතු වී ඇත.

පාර්ශවකරුවන්ගේ උපදෙස් ලබා ගැනීමේ දී පුළුල්ව භාවිතා වන තවත් ප්‍රවේශයක් නම් යෝජිත වෙනස්කම් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කර ඔවුන්ගේ අදහස් විමසීමයි. නියාමනයන්ගෙන් ඇතිවන බලපෑම් පිළිබඳව නිවැරදි තක්සේරු කිරීමටත්, අනුගතවීම ඉහළ නංවා ගැනීමටත්, ක්‍රියාවට නැංවීමේ පිරිවැය අවම කර ගැනීමටත් මෙමගින් හැකි වනු ඇත. පුළුල්-පරාස වල් නාශකයක් වන ග්ලයිෆොසේට් 2015 ඔක්තෝබර් මස දී තහනම් කිරීමත්, එකී තහනමෙන් ඇති වූ බලපෑමත් මගින් පැහැදිලිවම පෙන්නුම් කරන්නේ ලංකාවේ එවැනි උපදෙස් ලබා ගැනීමේ ක්‍රියාවලියක් නොමැති විමේ අහිතකර ඵලවිපාක ය. ඕස්ට්‍රේලියාව වෙත විසිතුරු මල් හා පැළ අපනයනයේ දී ගිල්වුම් ප්‍රතිකාරකය ලෙස භාවිතා කිරීමට අවසර ඇති එකම වල් නාශකය ග්ලයිෆොසේට් වීම නිසා මෙම තහනම එකී අපනයනකරුවන්ට තදින්ම බලපෑවේය. මෙම තහනම ගෙන ඒමට පෙර ඊට විකල්පයන් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සමහර භෝගවල ඵලදාවන් කැපී පෙනෙන කඩා වැටීමකට ද ලක් විය. එසේම විකල්පයන් නොමැති වීම හේතුවෙන් කෘෂි නිෂ්පාදකයින්ට මිනිස් ශ්‍රමයෙන් වල් නාශනය සිදු කිරීමට සිදු විය. ඉන් නිෂ්පාදන පිරිවැය කැපී පෙනෙන ලෙස ඉහළ යාම නිසා එය ලාභදායීත්වයට අහිතකර ලෙස බලපෑවේය. එමෙන්ම රට තුළට ග්ලයිෆොසෙට් හොරෙන් ගෙන ඒමේ සිදුවීම් වාර්තා වීමෙන් එම තහනමේ සාර්ථකත්වය පිළිබදවද ප්‍රශ්නාර්ථයක් පැන නැගිණි.

2. නියාමනයන් නිරතුරුව සමාලෝචනය කිරීමට හා යාවත්කාලීන කිරීමට අසමත් වීම.

නියාමනයන්ගේ අදාළත්වය හා ප්‍රයෝජනවත් බව ආරක්ෂා කර ගැනීමට නම් ඉන් නියාමනයට ලක් කෙරෙන නිෂ්පාදනයන් හා බැඳුනු ආර්ථික, පාරිසරික හා තාක්ෂණික කොන්දේසිවල ඇති වන වෙනස්කම්වලට අනුකූල වන පරිදි අදාළ නියාමනයන් සමාලෝචනයට ලක් කළ යුතු වේ. සමාලෝචනය සහ යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය, පැළ අපනයන හා ආනයනය කෙරෙහි බල පැවැත්වෙන තහංචි හා සීමාවන් කෙරෙහි විශේෂයෙන් අදළ වේ.

රට තුළ ඇති පැළ වර්ග විදේශීය පළිබෝධකයින්ගෙන් හා රෝගවලින් ආරක්ෂා කර ගැනීම සඳහා බිහි වී ඇති නියාමනයන් පසුගිය දශක තුනහමාර තුළ යාවත්කාලීන කිරීමට අසමත් වීම ශ්‍රී ලංකාව තුළ ක්‍රමානුකූල සමාලෝචන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමට අසමත් වීම පිළිබඳ නිදසුනකි. තහංචි හා සීමා කිරීම්වල දනට පවතින ලැයිස්තුව හරහා ඉදිරිපත් කෙරෙන ආරක්ෂණයේ ඇති අදළත්වය පිළිබඳ බරපතල සැකසංකා ඉන් මතු කරවයි. එමෙන්ම සමාලෝචනයන් සිදු කිරීමට අසමත් වීම නිසා මේ වනවිට අදළ නොවන හෝ ප්‍රයෝජනවත් නොවන සීමා කිරීම්වලට මුහුණ දීමට වෙළඳ ව්‍යාපාරිකයන්ට සිදුවන අතර, එවැනි අදාළ නොවන සීමා නියාමනයන් වෙළඳාම මත පැනවෙන අනවශ්‍ය බාධාවකි.

3. නියාමනයන් දුර්වල ලෙස නිර්මාණය කර තිබීම

නියාමනයන් නිර්මාණය කරන අදියර තුළ දී පාර්ශවකරුවන් ගේ උපදෙස් ලබා ගැනීමට හා නියාමනයන් හි බලපෑම පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට අසමත්වීම නිසා එම නියාමනයන් ක්‍රියාත්මක කිරීමේදී අහිතකර ප්‍රතිඵල ඇතිවීමට මග පාදනු ඇත. මේ සඳහා ඇති පැහැදිලි නිදසුනක් නම් ආනයනය කෙරෙන එළවළු ප්‍රභේදයන් පරීක්ෂාවට ලක් කිරීමට අදළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගෙවතු භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය මගින් නිකුත් කර ඇති මාර්ගෝපදේශන නිර්ණායකයන් ය. මෙම නිර්ණායකයන් මගින් ඇත්තෙන්ම සිදු වී ඇත්තේ බීජ ප්‍රභේදයන් පිළිබඳව බීජ සමාගම්වල ඒකාධිකාරයක් නිර්මාණය වීමත්, එමගින් බීජ සැපයුම්කරුවන් හා ප්‍රභේදයන් තෝරා ගැනීමට ගොවීන්ට ඇති නිදහස සීමා වීමත් ය. මේ ක්‍රමය තුළින් ඇතැම් බීජ සමාගම්වලට අයුතු වාසියක් අත් වන අතර වෙළඳපොල වෙත ඇතුළු වන නව තරගකරුවන් හට තරණය කිරීමට අපහසු බාධකයක් එමගින් නිර්මාණය කරවයි. එසේම නියාමනයන් නිර්මාණය කරන අදියරේ දී පාර්ශවකරුවන්ගේ පුළුල් උපදේශනයන් නොතිබීම හා බලපෑම් තක්සේරුවක් නොකිරීම හමුවේ නියාමන ක්‍රමයන් නිලධාරීන්ගේ සහ සමාගම්වල පටු අවශ්‍යතා පදනම්ව නිර්මාණය වීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිවිපාක පිළිබඳව මෙම සිද්ධිය

හොඳ උදහරණයකි.

පිළියම් ක්‍රියාමාර්ග^ මෙවැනි දේශීය බාධක ඉවත් කිරීම සඳහා වෙනත් රටවල් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගවලින් ශ්‍රී ලංකාවට පාඩම් උගත හැකිය. නිදසුනක් ලෙස නියාමනයන් ක්‍රියාවේ යෙදවීමට පෙර පොදු ජනයා වෙත පූර්ව දැනුම්දීම් සිදු කිරීම හා ඔවුන්ගේ අදහස් විමසීම සඳහා ක්‍රමවේදයක් බොහෝ රටවල ස්ථාපිත කර ඇත. එමෙන්ම නියාමනයන්ගේ අදාළත්වය දිගටම පවත්වා ගැනීම් වස් සැලසුම් කරන ලද නියාමන සමාලෝචනයන් ස්ථාවර කාලාන්තරයන් තුළ දී සිදු කිරීමට තවත් රටවල් කටයුතු පිළියෙල කර ඇත. දුර්වල ලෙස නිර්මාණය කරන ලද නියාමනයන් ප්‍රතිසංස්කරණය කිරීමෙන් රටකට ප්‍රතිලාභ අත්විය හැකි ආකාරය පිළිබඳ නිදසුන් ද පවතී. උදහරණයක් ලෙස, තුර්කිය විසින් සිදු කරන ලද බීජ ප්‍රතිසංස්කරණ හේතුවෙන් ඉහළ තරගකාරිත්වයක් මෙන්ම පුද්ගලික අංශයේ පුළුල් සහභාගිත්වයක් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස කෘෂි ඵලදායීත්වයේ හා අපනයන ආදායම්වල ඉහළ යෑමක් කරා මඟ විවර විය.

## ක්‍රියාපටිපාටිමය බාධක

ඵලදායී වූ ද පුරෝකථනය කළ හැකි වූ ද පාරදෘශ්‍යමය වූ ද නියාමන ක්‍රියාපටිපාටි මඟින් අනුගතභාවය වැඩි දියුණු වන අතර වෙළඳාම පහසු කරයි. දේශ සීමාව තුළ පවතින අකාර්යක්‍ෂම ක්‍රියාපටිපාටි හේතුවෙන් ශ්‍රී ලාංකික අපනයනකරුවන් පීඩාවට පත් වේ. ගෝලීය වෙළඳ හැකියා දර්ශකයේ (Global Trade Enabling Index) මිණුම්වලට අනුව දේශ සීමා ක්‍රියාපටිපාටිවල කාර්යක්‍ෂමතාවයේ ගෝලීය වර්ගීකරණය තුළ ශ්‍රී ලංකාවට හිමිව ඇති ස්ථානය තුළින් මෙය මනාව පිළිබිඹු වේ. මෙම ශ්‍රේණිගත කිරීම තුළ වසර දෙකක් ඇතුළත ශ්‍රී ලංකාව ස්ථාන දහයකින්, එනම් රටවල් 136 ක් අතුරින් 2014 දී සිටි 87 වන ස්ථානයේ සිට 2016 දී 97 වන ස්ථානය දක්වා පහළට වැටුණි. ශ්‍රී ලංකාව කලාපීය අනෙකුත් රටවල් වන තායිලන්තය (44වන ස්ථානය), ඉන්දියාව (75වන ස්ථානය) හා වියට්නාමය (86වන ස්ථානය) වැනි රටවල්වලට වඩා පසුපසින් සිටී. අකාර්යක්‍ෂමභාවය, ගතවන කාලය, වැයවන පිරිවැය. පුරෝකථනමය හැකියාව නොමැති වීම හා අන්තර්-ආයතන සම්බන්ධීකරණය දුර්වල වීම වෙළඳාම සඳහා ඇති ප්‍රධාන ක්‍රියාපටිපාටිමය බාධක ලෙස අධ්‍යයනය තුළ දී හඳුනා ගැනිණි.

1. අකාර්යක්‍ෂම ක්‍රියා පටිපාටි

අකාර්යක්‍ෂම ක්‍රියාපටිපාටි නිසා ප්‍රවාහනය අතරතුර වැය කිරීමට සිදුවන සෑම අමතර පැයක්ම කල්තබා ගත නොහැකි නිෂ්පාදනයනගේ ගුණාත්මකභාවයට හා වෙළඳ අගයට අහිතකර බලපෑමක් එල්ල කරයි. අකාර්යක්‍ෂම ක්‍රියාපටිපාටි හේතුවෙන් ඇති වූ ප්‍රමාදයන් අපනයන තරගකාරිත්වය කෙරෙහි ඇති කරන අහිතකර බලපෑම පෙන්නුම් කරන සිද්ධි අධ්‍යයන ගණනාවක් තිබේ.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ හරහා යැවෙන, කල් තබා ගත නොහැකි භාණ්ඩ පරීක්ෂා කිරීමේ ක්‍රියාවලිය එවැනි එක් සිද්ධි උදහරණයකි. එකිනෙකට වෙනස් අධිකාරීන් හතරක් මඟින් සිදු කෙරන වෙන් වෙන් පරීක්‍ෂාවන් හතරකට මෙම භාණ්ඩ ලක් කෙරේ. බොහෝ අවස්ථාවන්හි දී මේ පරීක්ෂාවන් සිදු කරනු ලබන්නේ කල් තබා ගත නොහැකි භාණ්ඩ හැසිරවීමේ පුහුණුවක් නොලත් නිළධාරීන් විසින් වන අතර පරීක්ෂා කරන අතරතුර සුළු සොරකම් සිදු වීම සුලබ සිද්ධියක් වී ඇත. පරීක්‍ෂාවන් සිදු කෙරෙන්නේ කිසිදු උෂ්ණත්ව පාලනයක් නොමැති ස්ථානවල ය. සමහර අවස්ථාවල දී විවෘත එළිමහනේ ය. එනිසා නිෂ්පාදනයන් ග්‍රීෂ්මයට හා විෂබීජකරණයට නිරාවරණය වේ. එමෙන්ම ආරක්‍ෂක නිළධාරීන්ට අවිදීම සඳහා පටු තීරුවක් ලොරි රථ තුළ හිස්ව තැබිය යුතු බවට ගුවන් හමුදාව විසින් පනවා ඇති නියමය හේතුවෙන් ලොරියකට පැටවිය හැකි ප්‍රමාණය සීමා වී ප්‍රවාහන වියදම් ඉහළ යෑමක් සිදු වේ. මෙම අකාර්යක්ෂමතාවල ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ ප්‍රවාහනයට ගත වන කාලය ඉහළ යන අතර, ප්‍රවාහන කරන භාණ්ඩවලට හානි වේ. කල් තබා ගත නොහැකි භාණ්ඩ අපනයනයේ තරගකාරිත්වයට තියුණු හානියක් ඉන් සිදු වේ.

අකාර්යක්ෂම ක්‍රියාපටිපාටි සඳහා ඇති තවත් පැහැදිලි උදහරණයක් නම් සමහර භාණ්ඩ ආනයන/අපනයනයට අදල රේඛීය අමාත්‍යංශයෙන්/ආයතනයෙන් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව දෙවැනි අනුමැතියක් සඳහා අපනයන හා ආනයන පාලන දෙපාර්තමේන්තුව වෙත යෑමට සිදු වීමයි. වර්තමානයේ දී අපනයන දෙපාර්තමේන්තුව නියාමන

අනුගතභාවය පැත්තෙන් ඉතා සුළු වශයෙන් පමණක් අගය එකතු කිරීමක් සිදු කරන අතර, එමඟින් හුදෙක් සිදුවන්නේ අන්තර්ජාතික වෙළඳාමේ නියුතු වූවන් වෙත අමතර කාලයක් හා පිරිවැයක් එකතු කිරීමක් පමණි.

2. අන්තර්-ආයතනික සම්බන්ධීකරණය දුර්වල වීම.

ආයතන අතර පවතින දුර්වල සන්නිවේදනය හේතුවෙන් අපනයනකරුවන්ට අනවශ්‍ය ප්‍රමාදයන්ට මුහුණ දීමට සිදු වේ. එය ඔවුන්ගේ අපනයන තරඟකාරිත්වයට අහිතකර ලෙස බලපායි. උදහරණයක් ලෙස ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනය (නාරා) සහ ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය අතර ඇති දුර්වල සම්බන්ධීකරණය හේතුවෙන් භාණ්ඩ නිෂ්කාශණය කර ගැනීම සඳහා අවශ්‍ය සෞඛ්‍යාරක්ෂක සහතිකය ලබා ගැනීමේ දී සිදුන විශාල ප්‍රමාදයන් පිළිබඳව මත්ස්‍ය අපනයනකරුවන් පැමිණිලි කිරීම දැක්විය හැකිය. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය මඟින් සෞඛ්‍යාරක්ෂණ සහතික නිකුත් කිරීම සඳහා නාරා ආයතනය මඟින් නිකුත් කරන පරීක්‍ෂණ වාර්තා පූර්ව අවශ්‍යතාවයකි. නියමිත වේලාවට එකී පරීක්‍ෂණ වාර්තා නොලැබීම හේතුවෙන් සෞඛ්‍යාරක්‍ෂණ සහතිකය නිකුත් කිරීමේ ප්‍රමාදයන්ට අපනයනකරුවන්ට මුහුණ දීමට සිදුවේ.

3. පුරෝකථනය කළ නොහැකි ක්‍රියාපටිපාටි

ලැයිස්තුගත ලේඛන ඉදිරිපත් කර, නියමිත ක්‍රියාමාර්ග අනුගමනය කළ හොත්, දෙන ලද කාල සීමාවන් ඇතුළත භාණ්ඩය නිෂ්කාශණය කළ හැකි යැයි විශ්වාසයකින් යුතුව දැනගත හැකි වීම වෙළඳ තරඟකාරිත්වයේ මූලික තීරණාත්මක සාධකයකි.

ශ්‍රී ලංකාව තුළ පොහොර ආනයන ක්‍රියාවලිය, මෙසේ පුරෝකථනය කළ නොහැකි ක්‍රියාවලීන්ගේ බලපෑම පැහැදිලිව පෙන්නුම් කරයි. එහිදී ලේඛන සැකසුම් කිරීමට හා භාණ්ඩ නිෂ්කාශණය කිරීමට ගතවන කාලය පිළිබඳව විශ්වාසයකින් යුතුව තක්සේරුවක් කිරීමට වෙළඳ ව්‍යාපාරිකයින්ට හැකියාවක් නොමැත. ජාතික පොහොර ලේකම් කාර්යාලය මඟින් දක්වා ඇති ක්‍රියාපටිපාටි නියමිත පරිදි අනුගමනය කිරීමෙන් පසුව පවා සිදුවන නිරන්තර ප්‍රමාදයන් පිළිබඳව බොහෝ ආනයනකරුවෝ පැමිණිලි කරති. අපනයන ක්‍රියාවලියම කල් ගත වන හා පීඩාකාරී එකක් වන අතර එයට එකතුවන තවත් ප්‍රමාදයන් අමතර බරකි. මෙය, ස්වකීය පොහොර අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් ආනයනවලින් සපුරා ගන්නා රටක් වන ශ්‍රී ලංකාවේ කෘෂි ඵලදායිත්වය හා අපනයන තරඟකාරිත්වය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි.

පිළියම් ක්‍රියාමාර්ග භාණ්ඩ අපනයනයේදී සහ අපනයනයේදී නියාමනයන් සමග අනුගත නොවීමක දී ඇතිවන අවදානම ආකෘතිගත කිරීමත්, අවදනමේ මට්ටමට සමානුපාතික වන ආකාරයේ සංසිඳවීම් ක්‍රියාමාර්ග හඳුන්වාදීමත් තුළින් නිරන්තරව භාණ්ඩ පරීක්ෂාවට ලක් කිරීමට ඇති අවශ්‍යතාවය අඩු කර ගැනීමට හැකි වනු ඇත. උදහරණයක් ලෙස එක්සත් රාජධානියේ දී ආනයන අවදනම් තක්සේරු පද්ධතිය මඟින් සෑම නැව් භාණ්ඩ තොගයක්ම අවදනමේ ප්‍රමාණය අනුව වර්ගීකරණයකට ලක් කෙරේ. ඉහළ අවදනම් ලෙස සැලකෙන භාණ්ඩ පමණක් 100% පරීක්ෂාවට ලක් කෙරේ. මැදි අවදනම් භාණ්ඩ පරීක්‍ෂාවට ලක් කෙරෙන්නේ අවස්ථාවෝචිත පදනම මතය. අඩු අවදනම් භාණ්ඩ කිසිදු පරීක්‍ෂාවකින් තොරව නිෂ්කාශණය කෙරේ.

ඊට අමතරව, දේශ සීමා නියාමනයන් ක්‍රියාත්මක කරන ආයතන අතර පවතින සම්බන්ධීකරණය හා සහයෝගය වැඩි දියුණු කිරීම මඟින් නියාමනයන්ට අනුගත බව තහවුරු කිරීමට ගතවන කාලය හා පිරිවැය කැපී පෙනෙන ලෙස අඩු කර ගත හැකි ය. උදහරණයක් ලෙස ජැමෙයිකාවේ ආනයන+-අපනයන පර්යේෂණ මධ්‍යස්ථානය මඟින් අන්තර් ආයතනික සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වා දීම තුළින් ආනයනික වෙළඳ භාණ්ඩ පරීක්‍ෂා කිරීම සඳහා සාමාන්‍යයෙන් ගතවන කාලය වසර 6ක් තුළ දී පැය 24 සිට පැය 4ක සාමාන්‍යයක් දක්වා අඩු කර ගනු ලැබිණි.

අනවශ්‍ය නීති රෙගුලාසි කපා හැරීම සඳහා රටවල් විසින් තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණවේදය වැඩි වැඩියෙන් යොදවා ගැනීමේ ප්‍රවණතාවයක් දකිය හැකිය. උදහරණයක් ලෙස මැලේසියාවේ ඇති ඉලෙක්ට්‍රොනික අවසරපත් (ඉ-අවසරපත්) පද්ධතිය මඟින් වසරක දී අවසර පත් 284,655ක් සැකසුම් කිරීමේ හැකියාව ලැබෙන අතර, එහිදී එක් අවසර

පතක් නිකුත් කිරීමේ ඉලෙක්ට්‍රොනික චක්‍රයක් සඳහා ගත වන්නේ දිනකට අඩු කාලයකි.

### තොරතුරුමය බාධක

නියාමනයන් හා ක්‍රියාපටිපාටි පිළිබඳව නිවැරදි අප්‍රමාදී තොරතුරු, පරිහරණ මිත්‍රශීලී ආකාරයකින් ලබා ගැනීමේ හැකියාව අපනයන සාර්ථකත්වය සඳහා තීරණාත්මක සාධකයක් වේ. නිවැරදි තොරතුරු නිවැරදි වේලාවට ලබා ගැනීමට නොහැකි වීම නිසා වෙළඳ ව්‍යාපාරිකයන්ට ප්‍රමාදයන්ට හා පාඩු වලට මුහුණ දීමට සිදුවේ. එමෙන්ම තොරතුරු සොයා ගැනීම සඳහා වැය කෙරෙන කාලය සහ මුදල් ද වෙළඳාමට බාධකයක් විය හැකිය. අධ්‍යයනය මඟින් පෙනී ගොස් ඇත්තේ වෙළඳාම හා සබැඳි නියාමන තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවය වෙළඳාමට ඇති ප්‍රධාන බාධකයක් බව ය.

1. අන්තර්ජාලය හරහා ලබාගත හැකි තොරතුරු සීමිත වීම

අන්තර්ජාලය හරහා තොරතුරු ලබා ගැනීමට සැලැස්වීම තුළින් තොරතුරු සෙවුම් පිරිවැය සහ කාලය කැපී පෙනෙන ලෙස පහත හෙළමින් විනිවිදභාවය ඉහල නැංවිය හැකි ය. පොදු ජනයා වෙත තොරතුරු ලැබෙන්නට සැලැස්වීමේ ඇති වඩාත්ම සාධාරණ ආකාරය මෙයයි. ඒ, එහිදී කාලය හා ස්ථානය යන සාධක මඟින් තොරතුරු ලබා ගැනීම සීමා නොකෙරෙන බැවිනි. වෙබ් අඩවි හරහා රජයේ තොරතුරු ක්ෂණිකව හා පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව, කොළඹින් පිට පිහිටා ඇති සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාරවලට විශේෂයෙන්ම වාසිදයක වනු ඇත්තේ එසේ නොමැතිවුවහොත් අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා කොළඹ පැමිණීමට කාලය සහ මුදල් වැය කිරීමට ඔවුන්ට සිදුවන බැවිනි. පර්යේෂණය මඟින් හෙළි වූයේ ශ්‍රී ලංකාව තුළ වෙබ් අඩවි හරහා ලබා ගත හැකි තොරතුරු බොහෝවිට සීමා සහිත වන අතර, තිබෙන බොහෝ තොරතුරු යල් පැනගිය ඒවා බවයි. ඒ අනුව අවශ්‍ය තොරතුරු ලබා ගැනීම සඳහා අදාළ ආයතනයන් වෙත දුරකථනයෙන් ඇමතීමට හෝ එකී කාර්යාල වෙත පුද්ගලිකවම යාමට වෙළඳ ව්‍යාපාරිකයින්ට බොහෝවිට සිදු වේ.

කෘෂි වෙළඳාම හා සබැඳි ප්‍රධාන ආයතන 7ක් සම්බන්ධව සම්බන්ධතා විස්තර, ඉල්ලුම්පත්, ක්‍රියාපටිපාටි, සීමා පැනවීම් ලැයිස්තු, ගාස්තු හා කාලසීමාවන් වැනි මූලික තොරතුරු අන්තර්ජාලය හරහා ලබා ගැනීමට ඇති හැකියාව මෙම වාර්තාව තුළ දී විශ්ලේෂණයට ලක් කෙරිණි. එම අධ්‍යයනයට අනුව අවශ්‍ය තොරතුරුවලින් අන්තර්ජාලය තුළ තිබුණේ 36%ක් පමණි. ඉතිරි 64% ලබා ගැනීමට නම් ආයතන පරිශ්‍රයන් වෙත යාමට හෝ අදල ආයතනය වෙත දුරකථන ඇමතුම් ලබා ගැනීමට හෝ සිදුව තිබිණි.

2. සිදුවන වෙනස්කම් පිළිබඳව වෙළඳ ව්‍යාපාරිකයින්ට පූර්ව දැනුම් දීමක් කිරීමට අසමත් වීම

අදළ නියාමන අධිකාරියේ ප්‍රධානියා වෙනස්වීමත් සමඟම ක්‍රියාපටිපාටිවල වෙනස්කම් සිදුවීම සුලබ වන බවත්, එම වෙනස්කම් අප්‍රමාදීව දැනුම් දෙනු නොලැබීම නිසා වෙළඳ ව්‍යාපාරිකයින්ට නව ක්‍රියාපටිපාටි වෙත හැඩ ගැසීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොලැබීම ගැටලුවකි. උදහරණයක් ලෙස විශේෂ පොහොර වර්ග ගෙන්වන එක් ව්‍යාපාරිකයෙකු වෙත, අදළ අමතර අනුමැතීන්ගේ අවශ්‍යතාවය පිළිබඳ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් නැව් භාණ්ඩ තොගය වරාය වෙත ලඟා වීමට පෙර දැනුම් දෙනු නොලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස භාණ්ඩ තොගය වරායෙන් නිදහස් කර ගැනීම සඳහා සාමාන්‍යයෙන් ගතවන දින 3ක කාලය වෙනුවට මාස 3ක කාලයක් ඒ සඳහා වැයවිය. එනිසා ප්‍රමාද ගාස්තු වශයෙන් විශාල මුදලක් ගෙවීමට ද සිදුවිය.

3. පරිහරණයට පහසු ආකාරයට තොරතුරු සැපයීමට අසමත් වීම.

තොරතුරු ලබා ගැනීමේ හැකියාව දියුණු කිරීමට නම් පරිහරණයට පහසු ආකාරයකින් තොරතුරු ප්‍රකාශයට පත් කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාව තුළ දී අන්තර්ජාලය ආශ්‍රිතව තිබෙන සීමිත තොරතුරු පවා සෙවීම දුෂ්කර ව්‍යායාමයකි. උදාහරණයක් ලෙස එක් නිෂ්පාදනයක් හා බැඳුණු යම් තනි ක්‍රියාපටිපාටියක එකිනෙකට වෙනස් විවිධ පැතිකඩ පිළිබඳ තොරතුරු අන්තර්ජාලයේ වෙබ් අඩවි ගණනාවක් පුරා විසිරී පැවතීම දැක්විය හැක.

නිෂ්පාදන කේතයක් හෝ නිෂ්පාදන නාමයක් ඇතුළත් කිරීමෙන් තොරතුරු, විශේෂයෙන්ම බදු හා වෙළඳ තොරතුරු වෙළඳ ව්‍යාපාරිකයින්ට පහසුවෙන් සෙවිය හැකි ආකාරයේ අන්තර්ජාල පහසුකම් රටවල් විසින් වැඩි වැඩියෙන් හඳුන්වා දෙමින් පවතී. ශ්‍රී ලංකාව තුළ බොහෝ ආයතන එවැනි පද්ධතීන් හඳුන්වා දීමක් තවම සිදු කර නොමැත. වර්තමානයේ දී HS කේතය අනුව පිළියෙළ වී ඇති වෙළඳාම හා සම්බන්ධ වඩාත් යාවත්කාලීන තොරතුරු ඇතුළත් මෘදු අනුපිටපත් අන්තර්ජාලය තුළ ලබා ගැනීමට නොහැකි අතර ඒවා ශ්‍රී ලංකා රේගුව හරහා මිලදී ගත යුතුය. එමෙන්ම ආනයනික භාණ්ඩවලට අදළ වන යාවත්කාලීන බදු තොරතුරු HS කේතයට අනුව අන්තර්ජාලය හරහා පහසුවෙන් සොයා ගත නොහැක.

පිළියම් ක්‍රියාමාර්ග-බොහෝ රටවල් වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ හා පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීමේ ක්‍රමයක් ලෙස වෙළඳ තොරතුරු අන්තර්ජාලය හරහා කේන්ද්‍රීය වෙබ් අඩවියක් මගින් ලබාදීමේ ප්‍රවණතාවක් පවතී. වෙළඳ තොරතුරු මෙවැනි කේන්ද්‍රීය වෙබ් අඩවියකින් අපේක්ෂා කෙරෙන්නේ පරිහරණයට පහසු ආකාරයෙන් එක් වෙබ් අඩවියක් හරහා වෙළඳ ව්‍යාපාරිකයින්ට අදළ වෙළඳ නීති, රෙගුලාසි, ක්‍රියාපටිපාටි, ගාස්තු ලැයිස්තු සහ දේශ සීමා කළමනාකරණ ආයතන සියල්ලේ ඉල්ලුම්පත් ආකෘති පත්‍ර ආදී තොරතුරු පහසුවෙන් සහ ඉක්මනින් සොයා ගැනීමේ හැකියාව වෙළඳ ව්‍යාපාරිකයින්ට ලබා දීමයි. 2017 අයවැය තුළ දී ශ්‍රී ලංකා රජය ජාතික වෙළඳ තොරතුරු සහිත මෙවැනි කේන්ද්‍රීය වෙබ් අඩවියක් ස්ථාපිත කිරීම සඳහා යෝජනා කර ඇත. කෙසේවෙතත් තොරතුරුවල අදළත්වය හා ප්‍රයෝජනවත් බව රැකෙන පරිදි ඒවා නිරතුරුවම යාවත්කාලීන කළ යුතු වීම නිසා එවැනි වෙබ් අඩවියක් පවත්වාගෙන යාම අභියෝගාත්මක කාර්යයක් බව මෙහිදී සඳහන් කිරීම වටී. එබැවින් එවැනි වෙබ් අඩවියක් ස්ථාපිත කිරීම වර්තමාන තොරතුරු ගැටළුව සඳහා විසඳුමක් වීමට නම් එම වෙළඳ තොරතුරු අදළ ආයතන වෙතින් සැපයුම සහතික කරලීමේ ආයතනික විධිවිධානයන් පිහිටු-වාලීම ඉතා වැදගත් වේ.

අවසාන වශයෙන් කිව යුත්තේ කෘෂි අපනයනවල ඇති සැඟවුණු විභවයන් ඉස්මතු කරවා ගැනීම සඳහා කළ යුතු බොහෝ වැඩ දේශීය තලය තුළ පවතින බවයි. අධ්‍යයනය මගින් හෙළි වූයේ දැනට පවතින දේශීය වෙළඳ බාධකවලින් බොහෝමයක් ප්‍රධාන ගැටළු දෙකක් ඇසුරින් පැන නගින බවයි. පළමුව, වෙළඳාම හා සබැඳි ප්‍රතිපත්ති සම්පාදන අවකාශය තුළ සිටින ප්‍රධාන පාර්ශවකරුවන් තිදෙනා අතර පවතින සන්නිවේදනයේ කැපී පෙනෙන දුර්වලතාවය - එනම් 1 ) නියාමනයන් ගොඩ නංවන ප්‍රතිපත්ති සම්පාදකයින්, 11 ) ක්‍රියාපටිපාටි මගින් නිර්මාණය කෙරෙන බාධක පිළිබඳ නොදැනුවත්ව සිටින හෝ දැනට පවතින ක්‍රමය තුළ තමන්ට ලැබෙන ලාභ ප්‍රයෝජන හා වරප්‍රසාද හේතුවෙන් එකී බාධකවලට විසඳුම් සෙවීමේ උනන්දුවක් නොමැති නියාමන ආයතන, හා 111 ) බාධක ජය ගැනීම සඳහා පුද්ගලික මට්ටමේ විසඳුම් වෙත බොහෝවිට යොමු වන පුද්ගලික අංශයේ වෙළඳ ව්‍යාපාරිකයින්ය. දෙවනුව, රාජ්‍ය අංශයේ වග වීම සහතික කළ හැකි යාන්ත්‍රණයන් ප්‍රමාණවත් නොවීමයි.

වෙනත් රටවල අත්දැකීම් තුලින් පෙන්නුම් කර ඇති පරිදි ඉහත විස්තර කළ බාධකයන් බහුතරයක් පහසුවෙන් විසඳා ගත හැකිය. කෙසේ වෙතත් දිගු කාලීන චිරස්තායි විසඳුම් සොයා ගැනීමට නම් දේශීය බාධකවල ඇති වැදගත්කම හඳුනාගැනීමේ හා ඒවා තුරන් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ අභිලාශය රජය සතුව තිබිය යුතුය. එමෙන්ම මෙම බාධක ඉවත් කිරීමට නම් වෙළඳාම හා සම්බන්ධිත නියාමන ආයතන එකී විසඳුම් ලබා දීම කෙරෙහි වගවිය යුතු බවට පුද්ගලික අංශය විසින් දැඩිව අවධාරණය කිරීම ඉතා වැදගත් වේ.

Verité Research
Strategic Analysis for Asia

A | No. 5A, Police Park Place, Colombo 5
T | +94 11-2055544
E | reception@veriteresearch.org
W| www.veriteresearch.org